


# ජාතික ස්වයංනිර්ණ අයිතිය සහ ජනතාව

ජාතික ස්වයං නිර්ණය නැමති අයිතියෙන් හැඟවෙන්නේ තමන්ගේ දේශපාලන ඉරණම තීන්දු කිරීමට යම්කිසි ජන කොටසකට තිබෙන අයිතියයි. ජාතික ස්වයං නිර්ණ අයිතිය ලෝකයේ බොහෝ තැන් වල ඉතාමත් සංකීර්ණ ප්‍රතිපත්ති සහ ප්‍රායෝගික ප්‍රශ්නයක් බවට පත් වෙලා. ලංකාවේ දමිළ ජන කොටස් වල අරගලයට අමතරව චීනය, රුසියාව, ජෝර්ජියාව, පැරණි යුගෝස්ලාවියාව, බුරුමය, ඉතියෝපියාව, ඕස්ට්‍රේලියාව ඇතුළු ලෝකයේ නොයෙක් තැන් වල මෙම අයිතිය මත පදනම් වුණු අරගල බොහොමයක් පවතිනවා.






දකුණු ඔසේෂියාවට ජෝර්ජියානු හමුදා ප්‍රහාර එල්ල කරමින්

ජාතික ස්වයං නිර්ණය නැමති අයිතියෙන් හැඟවෙන්නේ තමන්ගේ දේශපාලන ඉරණම තීන්දු කිරීමට යම්කිසි ජන කොටසකට තිබෙන අයිතියයි. ජාතික ස්වයං නිර්ණ අයිතිය ලෝකයේ බොහෝ තැන් වල ඉතාමත් සංකීර්ණ ප්‍රතිපත්ති සහ ප්‍රායෝගික ප්‍රශ්නයක් බවට පත් වෙලා. ලංකාවේ දමිළ ජන කොටස් වල අරගලයට අමතරව චීනය, රුසියාව, ජෝර්ජියාව, පැරණි යුගෝස්ලාවියාව, බුරුමය, ඉතියෝපියාව, ඕස්ට්‍රේලියාව ඇතුළු ලෝකයේ නොයෙක් තැන් වල මෙම අයිතිය මත පදනම් වුණු අරගල බොහොමයක් පවතිනවා. ඇතැම් විට නොයෙක් කොන්දේසි සහිතව සමහර පාලක පංතීන් මෙම අයිතිය පිළි අරගෙන තිබෙනවා. තවත් පාලක පංතීන් ජාතික ස්වයං නිර්ණයට තිබෙන අයිතිය එක හෙළාම ප්‍රතික්ෂේප කර සිටිනවා. එම අයිතිය සඳහා අරගල කරන භූමි ප්‍රදේශය තුළ පවතින වාස්ථවික තත්ත්වයන් මත එම අරගලයේ අන්තර්ගතය සහ ස්වරූපය තීරණය වෙනවා. ඇතැම් තැනෙක එවැනි අරගල සාමකාමී ස්වරූපයකිනුත්, තවත් තැනෙක සන්නද්ධ ස්වරූපයකිනුත් කෙරෙන බව දකින්නට පුළුවන්.




කොන්දේසි සහිත හෝ රහිත තත්වයක් තුළදී ජාතික ස්වයං නිර්ණය අයිතිය සම්බන්ධයෙන් පැන නැගී තිබෙන ප්‍රධානම ප්‍රතිපත්තිමය සහ ප්‍රායෝගික ගැටළු වල පදනම් වී තිබෙන්නේ, එම අයිතිය බුක්ති විඳිය හැක්කේ කවර ආකාරයේ ජනතාවක් විසින් දැයි යන කාරණය මතයි. මෙම අයිතියෙන් අදහස් වෙන්නේ යටත් විජිත වාදයෙන් නිදහස ලබන්නට ජන කොටස් වලට තිබෙන අයිතිය පමණක්ම ද? නැතහොත් පවතින ස්වාධීන රාජ්‍යයක දේශ සීමාවන් ඇතුළත ආණ්ඩු මාරු කිරීමට ජන කොටස් වලට තිබෙන අයිතිය පමණක් ද? වාර්ගික, භාෂාමය, ආගමික හෝ භෞමික හේතූන් මත ස්වෛරී රාජ්‍යයක් තුළම යම්කිසි ආකාරයක ස්වයං පාලනයක් ලබා ගැනීමට සහ, ඒ මත පදනම් වුණු අනන්‍යතාවක් පවත්වා ගෙන යාමට තිබෙන අයිතිය, මෙම අයිතිය තුළ ගැබ් වී තිබේද? බලය විභේදනය කරන ලද ක්‍රමයක් තුළ දේශපාලන ඒකකයක් ලෙස පවතින්නට ජන කොටසකට තිබෙන අයිතිය මීට ඇතුළත් වේද? පවතින රාජ්‍යයෙන් වෙන් වී ගොස් ස්වාධීන ස්වෛරී භාවයක් (රාජ්‍යයක්) ගොඩ නගා ගැනීමට ජන කොටසකට තිබෙන අයිතිය මීට ඇතුළත් වෙනවාද? එසේ නැතහොත් ජාතික ස්වයං නිර්ණ අයිතිය තුළ ඉහත දැක් වූ සියළු කාරණා අඩංගු වෙනවාද?

මා පසුව පෙන්වා දෙන අන්දමට එක්සත් ජාතීන්ගේ මණ්ඩලය විසින් ජාතික ස්වයං නිර්ණ අයිතිය නිර්වචනය කිරීමට යොදා ගෙන ඇත්තේ ජනතාව (peoples) යන වචනයයි. කවුද මේ කියන ජනතාව? මගේ අදහසේ හැටියට ජනතාව යන්නෙන් අදහස් කෙරෙන්නේ තමන් අතර පොදුවේ පවතින සහ, එකමුතුව හෝ එසේ නොමැතිව, හවුලේ භුක්ති විඳිය හැකි ඵල ප්‍රයෝජන සහිත වූ ජන ප්‍රජාවකි. එම ජන ප්‍රජාව තුළ සිටින පුද්ගලයන් අතර ඇති වෙන ගැටුම් ජනනාත්මක ලෙස අවම කරලීම එවැනි එක් ඵල ප්‍රයෝජනයක් විය හැකියි. එහෙත් ඔවුන් අතර පවතින විවිධත්වයන් අහෝසි කර දැක්වීමක් හෝ ඔවුන් සමජාතීයකරණයකට භාජනය කිරිම හෝ මෙයින් අදහස් නොවේ. එම ජන ප්‍රජාවේ ප්‍රගතිය සහ සංවර්ධනය උදෙසා එම ප්‍රජාව තුළ පවතින විවිධත්වය, විචිත්‍රත්වය සහ බහුවිධ භාවය නම්‍ය ලෙසත්, ජනනාත්මකවත්, ප්‍රායෝගික අන්දමිනුත් යොදා ගත හැකි ආ කාරයෙන් කටයුතු කරන රජයකට හෝ ආණ්ඩුවකට සිදු වෙන්නේ අනිවාර්යයෙන් එම විවිධත්වයන්ට සෑහෙන ස්වාධිපත්‍යයක් ඇතිව කටයුතු කළ හැකි ආකාරයට අධිකාරයක් සහ විධි ක්‍රමයක් සකස් කර ගැනීමයි.

එවැනි ආණ්ඩුවක්, එම ජන කොටස් වලට අපක්ෂපාතී ලෙසත්, සාධාරණ ලෙසත්, සමාන ආකාරයකිනුත් ක්‍රියා නොකොට, එක් ජන කොටසකට විශේෂ ඵල ප්‍රයෝජන ලබා දෙමින් තවත් කොටසක් විසින් භුක්ති විඳිය යුතුව තිබෙන ඵල ප්‍රයෝජන වලක්වාලමින් අත්තනෝමතික ලෙස ක්‍රියා කිරීම වලක්වාලිය හැකි ආකාරයේ ආණ්ඩුවක්, එම ජන කොටස් අතරින් පැන නගින විවිධ අභියෝගයන්ට ජනනාත්මක ලෙස ප්‍රතිචාර දැක්විය හැකි ආණ්ඩුවක්, දුෂ්ට ලෙස විවිධ ජන කොටස් පීඩාවට පත් කිරීම, කෲර ලෙස පාලනය කිරීම, සහ නීච ලෙස මර්දනය කිරීම වැනි කටයුතු අවම කර ගන්නට හැකි ආකාරයේ ආණ්ඩුවක් විය යුතුය. උදාහරණයක් ලෙස ලංකාව විවෘත ලෙසම යටත් විජිතයක්ව පැවැති කාලයේ, එම යටත් විජිත පාලනයට ගැතිකම් කල, ඒ අනුව නොයෙක් ආකාරයේ ප්‍රයෝජන ලබා ගැනීම සඳහා තමන්ගේ භාෂාව, ආගම සහ සංස්කෘතිය වෙනස් කරනු ලැබූ සිංහල, දමිළ සහ මුස්ලිම් ආදී වැසියන්ට එම පාලනය විසින් විශේෂ වර ප්‍රසාද සහ තාන්න මාන්න ලබා දුන් ආකාරය සිහිපත් කළ හැකියි. ඒ ආකාරයටම ලංකාව 1948න් පසුව පාලනය කල නව යටත් විජිතවාදී පාලකයන් විසින් ධනේෂ්වර පාර්ලිමේන්තු ක්‍රමය තුළ බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක් ලබා ගැනීම සඳහා ජන කොටස් බෙදා වෙන් කරමින් ගෙන ගිය සහ ගෙන යනු ලබන පාලනය ද සිහි කල හැකියි. මෙවැනි ආණ්ඩු විසින් තම රටේ ජන කොටස් ඒ ආකාරයට බෙදා වෙන් කිරීම සඳහා, ඇතැම් ජන කොටස් වෙත වෙනස්කම් කරන්නට ප්‍රතිපත්ති සකස් කිරීමත්, එවැනි වැරදි සහගත ප්‍රතිපත්ති අනුව පදනම් වූ වෙනස්කම් කිරීමේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමත් හේතුවෙන් යම්කිසි ජන කොටසක් එවැනි ආණ්ඩුවකට තව දුරටත් යටහත්ව සිටින්නට අකමැති වෙන්නේ නම් ඒ පිළිබඳව සීමිත ක්‍රියා මාර්ග කිහිපයක් පමණක් ගත හැකි බවයි මගේ අදහස.

ඉහත දැක් වූ ලෙස සෑම ජන කොටසකටම යුක්තිය සහ සාධාරණය ඉටු කරලිය හැකි ආකාරයෙන්, ඒ හැම ජන කොටසකටම ආත්ම ගෞරවයෙන් සහ සුරක්ෂිතතාවෙන් යුක්තව වාසය කල හැකි අන්දමේ ප්‍රතිපත්ති සහ වැඩ පිළිවෙළවල් නිර්මාණය කොට, ඒවා අව්‍යාජ ලෙසම ක්‍රියාවට නැගීම වඩාත්ම උචිත සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා මාර්ගය ලෙස යි මට පෙනෙන්නේ. මීට වඩා වෙනස් ආකාරයක් ගන්නා තවත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා මාර්ගයක් ලෙස මට පෙනෙන්නට තිබෙන්නේ, යම්කිසි ආණ්ඩුවකට ඉහත කී ආකාරයට ක්‍රියා කිරීමට නොහැකි නම්, තමන්ගේ පාලනය විසින් විශේෂ ඵල ප්‍රයෝජන භුක්ති විඳීමට සලස්වනු ලැබ තිබෙන ජන කොටසට පමණක් සීමා කර ගනිමින්, එම පාලනය විසින් වෙනස්කම් කිරීමට ලක් කොට සිටින අනෙක් ජන කොටස් වලට ඔවුන්ගේ සමාජමය, දේශපාලනික සහ ආර්ථික අනාගතය තීරණය කළ හැකි වෙන අන්දමකට ඔවුන් නිදහස් කර ලීමයි. ස්වෛරී පාලනයක ස්වරූපයේ සිට ඒකාබද්ධ රාජ්‍ය සංගමයක් දක්වා විහිදෙන ආකාරයේ පරාසයක් තුළ, එවැනි නිදහස් කිරීමක් අඩංගු කර ගත හැකියි.

තුන් වෙනි සහ ඉතාමත් අනුචිත සහ අයෝග්‍ය ක්‍රියා මාර්ගය ලෙස මට පෙනෙන්නේ, දුෂ්ට ලෙස අනෙක් ජන කොටස් පීඩාවට පත් කිරීම, කෲර ලෙස ඔවුන්ව පාලනය කිරීම සහ නීච ලෙස ඔවුන් මර්දනය කිරීමයි. මකියාවෙලීගේ දර්ශනය අනුව යමින්, දරුණු සහ කටුක ක්‍රියා මාර්ග යොදා ගැනීමෙන්, කෙටිකාලීනව වුවත් මෙවැනි අරගල විසඳ ගත හැකි වේයයි මම විශ්වාස නොකරමි. මෙවැනි ජන කොටස් පිළිබඳ අරගල සාර්ථක ලෙස විසඳ ගත හැක්කේ සදාචාරාත්මක භාවය ප්‍රතික්ෂේප නොකොට, ආත්මාර්ථකාමී නොවී, මානුෂිකභාවය පිරිහී යන්නට ඉඩකඩ නොදී, ඉතා සංවේදී ලෙස ක්‍රියා කිරීමෙන් පමණක්ය යන්නයි මගේ අදහස.

මෙම ක්‍රියා මාර්ග ප්‍රායෝගිකව ක්‍රියාත්මක වෙන්නේ කෙසේදැයි යන්න මී ළඟට සළකා බලමු.

ලයනල් බෝපගේ